# සිව්වැනි කොටස

## මහ බැංකුවේ සහ ශ්‍රී ලංකාවේ බැංකු ආයතනවල වැඩ කටයුතු හා මෙහෙයුම්වලට අදාළ 2015 සම්මත කරන ලද ප්‍රධාන නීති අණපනත්


පිටුව

1. 2015 අංක 10 දරන මුදල් පනත 1

# 2015 අංක 10 දරන මුදල් පනත

[සහතිකය සටහන් කළේ 2015 ඔක්තෝබර් මස 30 වන දින]

**මත්පැන් අලෙවිහල් සහ තැබෑරුම් අය බද්ද, කැසිනෝ කර්මාන්ත අය බද්ද, සුපිරි වාසි බද්ද, ජංගම දුරකථන ක්‍රියාකරු අය බද්ද, චන්ද්‍රිකා ස්ථාන අය බද්ද, ක්‍රීඩා සඳහා වෙන් වූ නාලිකා අය බද්ද, මන්දිර බද්ද, විගමන බද්ද සහ මෝටර් වාහන ආනයනකරුවන්ගේ බලපත්‍ර ගාස්තුව පැනවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද, ඊට සම්බන්ධ හා ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :–

1. මේ පනත 2015 අංක 10 දරන මුදල් පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

I වන කොටස

## මත්පැන් අලෙවිහල් සහ තැබෑරුම් අය බද්ද

2. (1) (52 වන අධිකාරය වූ) සුරාබදු ආඥාපනත යටතේ නිකුත් කරන ලද මේ පනතේ උපලේඛනයේ නිශ්චිතව සඳහන් වන, බලපත්‍රයක, 2015 මාර්තු මස 31 වන දිනට හිමිකරුවකු වූ සෑම තැනැත්තෙකුගෙන් ම රුපියල් දෙලක්ෂ පනස් දහසක් වන (මේ කොටසේ මින්මතු "අය බද්ද" යනුවෙන් සඳහන් කරනු ලබන) මත්පැන් අලෙවිහල් සහ තැබෑරුම් අය බද්ද යනුවෙන් හඳුන්වනු ලබන අය බද්දක් අය කරනු ලැබිය යුතුය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් කර ඇති බලපත්‍ර හිමිකරුවකු උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇති බලපත්‍ර එකකට වැඩි ප්‍රමාණයක් දරනු ලැබූ අවස්ථාවක, ඒ සෑම බලපත්‍රයක් සඳහා ම අය බද්ද ගෙවීමට ඔහු යටත් විය යුතු ය.

(3) අය බද්ද 2015 නොවැම්බර් මස 15 වන දින හෝ එදිනට පෙර ගෙවනු ලැබිය යුතු ය.

(4) අය බද්ද කොමසාරිස් ජනරාල්වරයා විසින් එකතු කරනු ලැබිය යුතු අතර, එකතු කිරීමේ දිනයේ සිට දින පහළොවක් ඇතුළත ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය.

3. (1) 2 වන වගන්තියේ විධිවිධාන සලස්වා ඇති පරිදි අය බද්ද ගෙවීම පැහැර හරින යම් බලපත්‍ර හිමිකරුවකු, මේ පනත යටතේ බදු පැහැර හරින්නකු ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) එවැනි යම් බදු පැහැර හරින්නකුට එරෙහිව නඩු පැවරීමට සහ පැහැර හරින ලද බදු අය කර ගැනීම සඳහා සහ ඒ සම්බන්ධයෙන් 4 වන වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

4. (1) අය බද්ද හෝ එයින් යම් කොටසක් ගෙවීම පැහැර හරිනු ලැබ ඇති විට, ගෙවීම පැහැර හැර ඇති බදු මුදල් ප්‍රමාණය සහ බදු පැහැර හරින්නාගේ නම සහ අවසාන වතාවට දැන සිටි පදිංචි ස්ථානය හෝ ව්‍යාපාරික ස්ථානයෙහි ලිපිනය පිළිබඳ විස්තර ඇතුළත් වන සහතිකයක්, කොමසාරිස් ජනරාල්වරයා විසින්, ඒ ස්ථානය කෙරෙහි අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත්වරයා වෙත නිකුත් කරනු ලැබිය යුතු ය.

(2) එවිට මහේස්ත්‍රාත්වරයා විසින්, බදු පැහැර හරින්නාට එරෙහිව එසේ ගෙවීම පැහැර හරිනු ලැබූ අය බද්ද අය කර ගැනීම පිණිස නඩු කටයුතු පවත්වාගෙන නොයා යුත්තේ මන්ද යන වගට හේතු දැක්වීම සඳහා බදු පැහැර හරින්නා කැඳවනු ලැබිය යුතු ය.

(3) බදු පැහැර හරින්නා විසින් ප්‍රමාණවත් හේතු දැක්වීමක් කරනු නොලැබුවහොත්, එම ගෙවීම පැහැර ඇති අය බදු මුදල ඒ පැහැර හරින්නාට මහේස්ත්‍රාත්වරයා විසින් නියම කරන ලද දඩ මුදලක් සේ මහේස්ත්‍රාත්වරයාගේ ආඥාවක් මඟින් අය කරගනු ලැබිය යුතු අතර, එසේ අය කර ගනු ලැබූ විට ඒකාබද්ධ අරමුදලට බැර කිරීම සඳහා කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ නියම කරන ලද දඩයට අමතරව, අදාළ බදු පැහැර හරින්නාට (52 වන අධිකාරය වූ) සුරාබදු ආඥාපනත යටතේ නිකුත් කරන ලද බලපත්‍රය, 2015 දෙසැම්බර් මස 31 වන දින සිට බලපැවැත්වෙන පරිදි කොමසාරිස් ජනරාල්වරයා විසින් අවලංගු කරනු ලැබිය හැකිය.

5. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ මේ කොටසේ-

"කොමසාරිස් ජනරාල්වරයා" යන්නෙන්, (52 වන අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 7 වන වගන්තිය යටතේ පත් කරන ලද සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා අදහස් වේ.

II වන කොටස

## කැසිනෝ කර්මාන්ත අය බද්ද

6. (1) 2015 ජනවාරි මස 29 වන දිනට, කැසිනෝ ව්‍යාපාරයක නියැලී සිටි සෑම තැනැත්තකුගෙන් ම, රුපියල් මිලියන එක් දහසක් වන (මේ කොටසේ මින්මතු "අය බද්ද" යනුවෙන් සඳහන් කරනු ලබන) කැසිනෝ කර්මාන්ත අය බද්ද යනුවෙන් හඳුන්වනු ලබන අය බද්දක් අය කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් තැනැත්තකු කැසිනෝ එකකට වඩා වැඩි ප්‍රමාණයක් ඇති ව්‍යාපාරයක නියැලී සිටි අවස්ථාවක, ඒ තැනැත්තා ඒ සෑම කැසිනෝවක් සම්බන්ධයෙන්ම අය බද්ද ගෙවීමට යටත් විය යුතු ය.

(3) අය බද්ද 2015 නොවැම්බර් මස 15 වන දින හෝ එදිනට පෙර ගෙවනු ලැබිය යුතු ය.

(4) අය බද්ද කොමසාරිස් ජනරාල්වරයා විසින් එකතු කරනු ලැබිය යුතු අතර, එකතු කිරීමේ දිනයේ සිට දින පහළොවක් ඇතුළත ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය.

7. (1) 6 වන වගන්තියේ විධිවිධාන සලස්වා ඇති පරිදි අය බද්ද ගෙවීම පැහැර හරින යම් තැනැත්තකු, මේ පනත යටතේ බදු පැහැර හරින්නකු ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) එවැනි යම් බදු පැහැර හරින්නකුට එරෙහිව නඩු පැවරීමට සහ පැහැර හරින ලද බදු අයකර ගැනීම සඳහා සහ ඒ සම්බන්ධයෙන් 8 වන වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

8. (1) අය බද්ද හෝ එයින් යම් කොටසක් ගෙවීම පැහැර හරිනු ලැබ ඇති විට, ගෙවීම පැහැර හැර ඇති බදු මුදල් ප්‍රමාණය සහ බදු පැහැර හරින්නාගේ නම සහ අවසාන වතාවට දැන සිටි පදිංචි ස්ථානය හෝ ව්‍යාපාරික ස්ථානයෙහි ලිපිනය පිළිබඳ විස්තර ඇතුළත් වන සහතිකයක්, කොමසාරිස් ජනරාල්වරයා විසින්, ඒ ස්ථානය කෙරෙහි අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත්වරයා වෙත නිකුත් කරනු ලැබිය යුතු ය.

(2) එවිට මහේස්ත්‍රාත්වරයා විසින්, එසේ ගෙවීම පැහැර හරිනු ලැබූ අය බද්ද අය කර ගැනීම පිණිස බදු පැහැර හරින්නාට එරෙහිව නඩු කටයුතු පවත්වාගෙන නොයා යුත්තේ මන්ද යන වගට හේතු දැක්වීමට බදු පැහැර හරින්නා කැඳවනු ලැබිය යුතු ය.

(3) බදු පැහැර හරින්නා විසින් ප්‍රමාණවත් හේතු දැක්වීමක් කරනු නොලැබුවහොත්, එම ගෙවීම පැහැර හැර ඇති අය බදු මුදල ඒ පැහැර හරින්නාට මහේස්ත්‍රාත්වරයා විසින් නියම කරන ලද දඩ මුදලක් සේ මහේස්ත්‍රාත්වරයාගේ ආඥාවක් මගින් අය කරගනු ලැබිය යුතු අතර, එසේ අය කර ගනු ලැබූ විට ඒකාබද්ධ අරමුදලට බැර කිරීම සඳහා කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය.

9. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ මේ කොටසේ-

"කැසිනෝ" යන්නෙන්,

(අ) ගෙවීමක් කර හෝ නොකර නැතහොත්;

(ආ) අයිතිවාසිකමක් මත හෝ එසේ නැතිව,

ඔට්ටුවක් සඳහා යම් ක්‍රීඩාවක් කිරීමට පුද්ගලයින්ට ඇතුළුවිය හැකි ස්ථානයක් අදහස් වන අතර, ඊට බකාරා, පුන්ටෝබැංකෝ, බිග්සික්ස්, බ්ලැක් ජැක්, බූවලේ, චෙමින්ඩිෆර්, චක් අ ලක්, ක්‍රවුන් ඇන්ඩ් ඇන්කර්, ෆාරෝ, ෆාරෝ බැන්ක්, හසාඩ්, පෝකර් ඩයිස්, පොන්ටූන්, ඇමරිකානු හෝ ප්‍රංශ රූලේ, ට්‍රෙන්ටේ - එට් ක්වොරන්ටේ, විංග්-එට්-උම්, වීල් ඔෆ් ෆෝචූන් හෝ අමාත්‍යවරයා විසින් කලින් කල නියෝග මගින් නියම කරනු ලැබිය හැකි වෙනත් යම් ක්‍රීඩාවක් ඇතුළත් වේ;

"කොමසාරිස් ජනරාල්වරයා" යන්නෙන්, 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත යටතේ පත් කරන ලද හෝ පත් කරන ලදැයි සලකනු ලබන දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා අදහස් වේ;

"තැනැත්තා" යන්නට 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි සමාගමක් සහ 2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනත යටතේ බලපත්‍රලාභී තැනැත්තකු හෝ සමාගමක් ඇතුළත් වේ.

## III වන කොටස

## සුපිරි වාසි බද්ද

10. (1) මේ කොටසේ අනෙකුත් විධිවිධානවලට යටත්ව, (මේ කොටසේ මින්මතු "බද්ද" යනුවෙන් සඳහන් කරනු ලබන) සුපිරි වාසි බද්ද යනුවෙන් හඳුන්වනු ලබන බද්දක්—

(අ) 2013 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වූ තක්සේරු වර්ෂය සඳහා වන විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශයට අනුව, ආදායම් බදු ගෙවීමට පෙර ලාභය රුපියල් මිලියන දෙදහසක් ඉක්මවන්නා වූ යම් සමාගමක් හෝ පුද්ගලයකුගෙන්, එම තක්සේරු වර්ෂය සඳහා එම සමාගමේ හෝ පුද්ගලයාගේ බදු අය කළ හැකි ආදායම මත, සියයට විසි පහක අනුප්‍රමාණයකට අය කරනු ලැබිය යුතු ය;

(ආ) 2013 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වූ තක්සේරු වර්ෂය සඳහා වන විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශවලට අනුව, සියලු පාලිත සමාගම්වල සහ පාලක සමාගමේ ආදායම් බදු ගෙවීමට පෙර ලාභවල එකතුව රුපියල් මිලියන දෙදහසක් ඉක්මවන සමාගම් සමූහයක, යම් ඕනෑම සමාගමක ආදායම් බදු ගෙවීමට පෙර ලාභය රුපියල් මිලියන දෙදහසක් නොඉක්මවූව ද, එය නොතකා, එම සමාගම් සමූහයේ එක් එක් සමාගමේ එම තක්සේරු වර්ෂයේ බදු අය කළ හැකි ආදායම මත, සියයට විසිපහක අනුප්‍රමාණයකට, අය කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, 2013 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වූ තක්සේරු වර්ෂය සඳහා වන විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශය අනුව, සමාගම් සමූහයක යම් සමාගමක ආදායම් බදු ගෙවීමට පෙර ලාභය රුපියල් මිලියන දෙදහසක් ඉක්මවන නමුත්. 2013 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වූ තක්සේරු වර්ෂය සඳහා, ඒ සමාගම් සමූහයේ සියළු පාලිත සමාගම් සහ පාලක සමාගමේ ගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ මත ආදායම් බදු ගෙවීමට පෙර ලාභවල එකතුව රුපියල් මිලියන දෙදහසක් නොඉක්මවන අවස්ථාවක දී, එම සමාගමෙන් පමණක් බද්ද අය කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්යය සඳහා, "බදු අය කළ හැකි ආදායම" යන්නෙන් —

(අ) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ගිවිසුමකට එළඹී සිටින්නා වූ ද, ඒ ගිවිසුමේ දක්වා ඇති බදුවලින් නිදහස් කාලසීමාව ඉකුත් වීමෙන් පසුව, ඒ ගිවිසුමට අනුව නිශ්චය කරන ලද ආදායම් බදු ගෙවීමට යටත් වී සිටින්නා වූ ද සමාගමකට අදාළව, ඒ සමාගමේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශයට අනුව ආදායම් බදු ගෙවීමට පෙර ලාභය අදහස් වේ;

(ආ) පුද්ගලයෙකුට හෝ (අ) ඡේදයේ සඳහන් කර ඇති සමාගම් නොවන සමාගමකට අදාළව, 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ ඒ යෙදුමට දී ඇති අර්ථය ම තිබිය යුතු ය.

(3) මේ කොටස යටතේ බද්ද ගෙවීමට යටත් යම් පුද්ගලයකු හෝ සමාගමක් විසින් එම පුද්ගලයාගේ හෝ සමාගමේ බදු අය කළ හැකි ආදායම මත යම් තක්සේරුවක් සිදු කරනු නොලැබුව ද, එය නොතකා, 2015 ඔක්තෝබර් මස 31 වන දින, නොවැම්බර් මස 30 වන දින සහ දෙසැම්බර් මස 31 වන දින හෝ ඒ දිනවලට පෙර සමාන වාරික තුනකින් බද්ද ගෙවනු ලැබිය යුතු ය.

(4) බද්ද කොමසාරිස් ජනරාල්වරයා විසින් එකතු කරනු ලැබිය යුතු අතර, එකතු කිරීමේ දිනයේ සිට දින පහළොවක් ඇතුළත ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය.

(5) මේ කොටසේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි විධිවිධාන, මේ පනත යටතේ සාදනු ලබන නියෝග මගින් නියම කරනු ලැබිය යුතු ය.

(6) (1) වන උපවගන්තිය යටතේ ගණනය කරන ලද බද්ද, (3) වන උපවගන්තියෙහි විධිවිධාන සලස්වා ඇති ආකාරයට කොමසාරිස් ජනරාල්වරයා වෙත ගෙවීම, සමාගම් සමූහයක සෑම පාලිත සමාගමක සහ පාලක සමාගමේ ම කාර්යය විය යුතු ය.

(7) සමාගම් සමූහයක පාලිත සමාගමක හෝ පාලක සමාගමේ යම් තදනන්තර ඈවර කිරීමක් මේ කොටස යටතේ බද්ද ගෙවීමට යටත් වීමෙන් ඒ සමාගම නිදහස් කරනු නොලැබිය යුතු ය.

(8) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, එය නොතකා-

(අ) මේ කොටස යටතේ අය කරනු ලබන බද්ද, 2013 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වූ තක්සේරු වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශයේ වූ වියදමක් ලෙස සලකනු ලැබිය යුතු ය;

(ආ) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත යටතේ යම් තක්සේරු වර්ෂයක් සඳහා බදු අය කළ හැකි ආදායම ගණනය කිරීමේ දී, මේ කොටස යටතේ බද්ද ගෙවීම වෙනුවෙන් කිසිදු අඩු කිරීමක් කරනු නොලැබිය යුතු ය;

(ඇ) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත යටතේ ගෙවිය යුතු බදු ගණනය කිරීමේ දී, මේ කොටස යටතේ බද්ද ගෙවීම වෙනුවෙන් කිසිදු අඩු කිරීමක් කරනු නොලැබිය යුතු ය;

(ඈ) 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත යටතේ ගෙවිය යුතු බදු ගණනය කිරීමේ දී, මේ කොටස යටතේ බද්ද ගෙවීම වෙනුවෙන් කිසිදු අඩු කිරීමක් කරනු නොලැබිය යුතු ය.

11. (1) මේ කොටස යටතේ බද්ද ගෙවීමට යටත් වන යම් සමාගමක්, පුද්ගලයෙක් හෝ සමාගම් සමූහයක්, ඒ බද්ද මේ කොටසේ විධිවිධාන සලස්වා ඇති පරිදි ගෙවීම පැහැර හරිනු ලැබූ අවස්ථාවක, ඒ සමාගම, පුද්ගලයා හෝ සමාගම් සමූහය මේ පනත යටතේ බදු පැහැර හරින්නකු ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ XII වන පරිච්ඡේදයේ, XXII වන පරිච්ඡේදයේ, XXIII වන පරිච්ඡේදයේ, XXIV වන පරිච්ඡේදයේ, XXV වන පරිච්ඡේදයේ, XXVI වන පරිච්ඡේදයේ, XXVII වන පරිච්ඡේදයේ, XXX වන පරිච්ඡේදයේ සහ XXXI වන පරිච්ඡේදයේ විධිවිධාන, එවැනි යම් බදු පැහැර හරින්නකු සඳහා ද, ඔහු සම්බන්ධයෙන් ද, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

12. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ මේ කොටසේ—

"කොමසාරිස් ජනරාල්වරයා", "සමාගම" සහ "තක්සේරු වර්ෂය" යන යෙදුම්වලට 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ ඒ යෙදුම්වලට, පිළිවෙලින් දී ඇති අර්ථය ම ඇත;

"සමාගම් සමූහය" යන්නෙන් පාලක සමාගමක් සහ එහි පාලිත සමාගම් අදහස් වේ;

"පාලක සමාගම" යන්නෙන්, ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපනය කරන ලද සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ XVIII වන පරිච්ඡේදය යටතේ ලියාපදිංචි නොකරන ලද පාලක සමාගමක් හැර, වෙනත් සමාගමක ඡන්දය දීමේ අයිතිය සහිත කොටස්වලින් සියයට පනහක ප්‍රතිශතයකට වැඩියෙන්, සෘජුව හෝ වක්‍රව හිමිකාරත්වය ඇති සමාගමක් අදහස් වේ;

"පාලිත සමාගම" යන්නෙන්, ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපනය කරන ලද සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ XVIII වන පරිච්ඡේදය යටතේ ලියාපදිංචි නොකරන ලද පාලක සමාගමක, ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපනය කරන ලද සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ XVIII වන පරිච්ඡේදය යටතේ ලියාපදිංචි නොකරන ලද පාලිත සමාගමක් හැර, ස්වකීය කොටස්වලින් සියයට පනහකට වැඩි ප්‍රතිශතයක ඡන්දය දීමේ අයිතිය සහිත කොටස් ප්‍රමාණයක්, සෘජුව හෝ වක්‍රව වෙනත් සමාගමකට හිමිකාරත්වය ඇති සමාගමක් අදහස් වේ.

IV වන කොටස

## ජංගම දුරකථන ක්‍රියාකරු අය බද්ද

13. (1) 2015 මාර්තු මස 31 වන දිනට, බලපත්‍රලාභී ජංගම දුරකථන ක්‍රියාකරුවකුගේ ව්‍යාපාරයේ නියැලී සිටි සෑම තැනැත්තකුගෙන් ම, රුපියල් මිලියන දෙසිය පනහක් වන (මේ කොටසේ මින්මතු "අය බද්ද" යනුවෙන් සඳහන් කරනු ලබන) ජංගම දුරකථන ක්‍රියාකරු අය බද්ද යනුවෙන් හඳුන්වනු ලබන අය බද්දක් අය කරනු ලැබිය යුතු ය.

(2) අය බද්ද 2015 නොවැම්බර් මස 15 වන දින හෝ එදිනට පෙර ගෙවනු ලැබිය යුතු ය.

(3) අය බද්ද (මේ කොටසේ මින් මතු "කොමිෂන් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් එකතු කරනු ලැබිය යුතු අතර, එකතු කරනු ලැබූ දිනයේ සිට දින පහළොවක් ඇතුළත ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය.

14. (1) 13 වන වගන්තියේ විධිවිධාන සලස්වා ඇති පරිදි අය බද්ද ගෙවීම පැහැර හරින යම් තැනැත්තකු, මේ පනත යටතේ බදු පැහැර හරින්නකු ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) එවැනි යම් බදු පැහැර හරින්නකුට එරෙහිව නඩු පැවරීමට සහ පැහැර හරින ලද අය බද්ද අය කර ගැනීම සඳහා සහ ඒ සම්බන්ධයෙන්, 15 වන වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

15. (1) අය බද්ද හෝ එයින් යම් කොටසක් ගෙවීම පැහැර හරිනු ලැබ ඇති විට, ගෙවීම පැහැර හැර ඇති මුදල් ප්‍රමාණය සහ බදු පැහැර හරින්නාගේ නම සහ අවසාන වතාවට දැන සිටි පදිංචි ස්ථානය හෝ ව්‍යාපාරික ස්ථානයේ ලිපිනය පිළිබඳ විස්තර ඇතුළත් වන සහතිකයක්, කොමිෂන් සභාව විසින්, ඒ ස්ථානය කෙරෙහි අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත්වරයා වෙත නිකුත් කරනු ලැබිය යුතු ය.

(2) එවිට මහේස්ත්‍රාත්වරයා විසින්, බදු පැහැර හරින්නාට විරුද්ධව එසේ ගෙවීම පැහැර හරිනු ලැබූ අය බද්ද අය කර ගැනීම පිණිස නඩු කටයුතු පවත්වාගෙන නොයා යුත්තේ මන්ද යන වගට හේතු දැක්වීම සඳහා බදු පැහැර හරින්නා කැඳවනු ලැබිය යුතු ය.

(3) බදු පැහැර හරින්නා විසින් ප්‍රමාණවත් හේතු දැක්වීමක් කරනු නොලැබුවහොත්, එම ගෙවීම පැහැර හැර ඇති අය බදු මුදල ඒ පැහැර හරින්නාට මහේස්ත්‍රාත්වරයා විසින් නියම කරන ලද දඩයක් සේ මහේස්ත්‍රාත්වරයාගේ ආඥාවක් මගින් අය කරගනු ලැබිය යුතු අතර, එසේ අය කර ගනු ලැබූ විට ඒකාබද්ධ අරමුදලට බැර කිරීම සඳහා කොමිෂන් සභාව වෙත ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය.

16. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ මේ කොටසේ -

"බලපත්‍රලාභී ජංගම දුරකථන ක්‍රියාකරු" යන්නෙන්, හුදෙක් ම පොදු ගෙවීම් දුරකථන සේවා සැපයීම සඳහා බලය පවරන ලද ක්‍රියාකරුවකු නොවන, 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 17 වන වගන්තිය යටතේ බලපත්‍රලාභී ක්‍රියාකරුවකු අදහස් වේ;

"තැනැත්තා" යන්නට සංස්ථාගත කරන ලද හෝ සංස්ථාගත නොකරන ලද පුද්ගල මණ්ඩලයක් ඇතුළත් වේ.

V වන කොටස

## චන්ද්‍රිකා ස්ථාන අය බද්ද

17. (1) 2015 මාර්තු මස 31 වන දිනට චන්ද්‍රිකාවල හිමිකාරත්වය ඇතිව සිටි සහ ශ්‍රී ලාංකික චන්ද්‍රිකා ස්ථාන භාවිත කිරීමට අවසර ලැබූ, යම් තැනැත්තකුගෙන්, රුපියල් මිලියන එක් දහසක් වන (මේ කොටසේ මින්මතු "අය බද්ද" යනුවෙන් සඳහන් කරනු ලබන) චන්ද්‍රිකා ස්ථාන අය බද්ද යනුවෙන් හඳුන්වනු ලබන අය බද්දක් අය කරනු ලැබිය යුතු ය.

(2) අය බද්ද 2015 නොවැම්බර් මස 15 වන දින හෝ එදිනට පෙර ගෙවනු ලැබිය යුතු ය.

(3) (මේ කොටසේ මින්මතු "කොමිෂන් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් අය බද්ද එකතු කරනු ලැබිය යුතු අතර, එකතු කිරීමේ දිනයේ සිට දින පහළොවක් ඇතුළත ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය.

18. (1) 17 වන වගන්තියේ විධිවිධාන සලස්වා ඇති පරිදි අය බද්ද ගෙවීම පැහැර හරින යම් තැනැත්තකු, මේ පනත යටතේ බදු පැහැර හරින්නකු ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) එවැනි යම් බදු පැහැර හරින්නකුට එරෙහිව නඩු පැවරීමට සහ පැහැර හරින ලද අය බද්ද අය කරගැනීම සඳහා සහ ඒ සම්බන්ධයෙන්, 19 වන වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

19. (1) අය බද්ද හෝ එයින් යම් කොටසක් ගෙවීම පැහැර හරිනු ලැබ ඇති විට, ගෙවීම පැහැර හැර ඇති බදු මුදල් ප්‍රමාණය සහ බදු පැහැර හරින්නාගේ නම සහ අවසාන වතාවට දැන සිටි පදිංචි ස්ථානය හෝ ව්‍යාපාරික ස්ථානයේ ලිපිනය පිළිබඳ විස්තර ඇතුළත් වන සහතිකයක්, කොමිෂන් සභාව විසින්, ඒ ස්ථානය කෙරෙහි අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත්වරයා වෙත නිකුත් කරනු ලැබිය යුතු ය.

(2) මහේස්ත්‍රාත්වරයා විසින්, එවිට බදු පැහැර හරින්නාට එරෙහිව එසේ ගෙවීම් පැහැර හරිනු ලැබූ අය බද්ද අය කර ගැනීම පිණිස නඩු කටයුතු පවත්වාගෙන නොයා යුත්තේ මන්ද යන වගට හේතු දැක්වීම සඳහා බදු පැහැර හරින්නා කැඳවනු ලැබිය යුතු ය.

(3) බදු පැහැර හරින්නා විසින් ප්‍රමාණවත් හේතු දැක්වීමක් කරනු නොලැබුවහොත්, එම ගෙවීම පැහැර හැර ඇති අය බදු මුදල ඒ පැහැර හරින්නාට මහේස්ත්‍රාත්වරයා විසින් නියම කරන දඩ මුදලක් සේ මහේස්ත්‍රාත්වරයාගේ ආඥාවක් මගින් අය කරගනු ලැබිය යුතු අතර, එසේ අය කර ගනු ලැබූ විට ඒකාබද්ධ අරමුදලට බැර කිරීම සඳහා කොමිෂන් සභාව වෙත ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය.

20. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ මේ කොටසේ—

"ශ්‍රී ලාංකික චන්ද්‍රිකා ස්ථානය" යන්නෙන් චන්ද්‍රිකා හරහා සේවා සැපයීමේ හා ලබා ගැනීමේ කාර්යය සඳහා ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය විසින් ශ්‍රී ලංකාව වෙත වෙන් කරනු ලැබ ඇති කක්ෂීය ස්ථානයක් අදහස් වේ;

"තැනැත්තා" යන්නට සංස්ථාගත කරන ලද හෝ සංස්ථාගත නොකරන ලද පුද්ගල මණ්ඩලයක් ඇතුළත් වේ.

VI වන කොටස

## ක්‍රීඩා සඳහා වෙන් වූ නාලිකා අය බද්ද

21. (1) 1982 අංක 6 දරන ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනත යටතේ නිකුත් කරන ලද ලියාපදිංචි කිරීමේ සහතිකයක බලය යටතේ, 2015 ජනවාරි මස 29 වන දිනට විකාශන ස්ථාන පහක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් භාවිත කරමින් ක්‍රීඩා සඳහා වෙන් වූ දීපව්‍යාප්ත නාලිකාවක් පවත්වාගෙන යෑමේ ව්‍යාපාරයක්, 2015 මාර්තු මස 31 වන දිනයේ දී කර ගෙන යනු ලැබූ සෑම තැනැත්තකුගෙන් ම, රුපියල් මිලියන එක් දහසක් වන (මේ කොටසේ මින්මතු "අය බද්ද" යනුවෙන් සඳහන් කරනු ලබන) ක්‍රීඩා සඳහා වෙන් වූ නාලිකා අය බද්ද යනුවෙන් හඳුන්වනු ලබන අය බද්දක් අය කරනු ලැබිය යුතු ය.

(2) අය බද්ද 2015 නොවැම්බර් මස 15 වන දින හෝ එදිනට පෙර ගෙවනු ලැබිය යුතු ය.

(3) අය බද්ද (මේ කොටසේ මින්මතු "කොමිෂන් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් එකතු කරනු ලැබිය යුතු අතර, එකතු කිරීමේ දිනයේ සිට දින පහළොවක් ඇතුළත ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය.

22. (1) 21 වන වගන්තියේ විධිවිධාන සලස්වා ඇති පරිදි අය බද්ද ගෙවීම පැහැර හරින යම් තැනැත්තකු, මේ පනත යටතේ බදු පැහැර හරින්නකු ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) එවැනි යම් බදු පැහැර හරින්නකුට එරෙහිව නඩු පැවරීමට සහ පැහැර හරින ලද අය බද්ද අයකර ගැනීම සඳහා සහ ඒ සම්බන්ධයෙන්, 23 වන වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

23. (1) අය බද්ද හෝ එයින් යම් කොටසක් ගෙවීම පැහැර හරිනු ලැබ ඇති විට, ගෙවීම පැහැර හැර ඇති බදු මුදල් ප්‍රමාණය සහ බදු පැහැර හරින්නාගේ නම සහ අවසාන වතාවට දැන සිටි පදිංචි ස්ථානය හෝ ව්‍යාපාරික ස්ථානයේ ලිපිනය පිළිබඳ විස්තර ඇතුළත් වන සහතිකයක්, කොමසාරිස් ජනරාල්වරයා විසින්, ඒ ස්ථානය කෙරෙහි අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත්වරයා වෙත නිකුත් කරනු ලැබිය යුතු ය.

(2) එවිට මහේස්ත්‍රාත්වරයා විසින්, බදු පැහැර හරින්නාට එරෙහිව එසේ ගෙවීම පැහැර හරිනු ලැබූ අය බද්ද අය කර ගැනීම පිණිස නඩු කටයුතු පවත්වාගෙන නොයා යුත්තේ මන්ද යන වගට හේතු දැක්වීම සඳහා බදු පැහැර හරින්නා කැඳවනු ලැබිය යුතු ය.

(3) බදු පැහැර හරින්නා විසින් ප්‍රමාණවත් හේතු දැක්වීමක් කරනු නොලැබුවහොත්, එම ගෙවීම පැහැර හැර ඇති අය බදු මුදල ඒ පැහැර හරින්නාට මහේස්ත්‍රාත්වරයා විසින් නියම කරන ලද දඩ මුදලක් සේ මහේස්ත්‍රාත්වරයාගේ ආඥාවක් මගින් අය කරගනු ලැබිය යුතු අතර, එසේ අය කර ගනු ලැබූ විට ඒකාබද්ධ අරමුදලට බැර කිරීම සඳහා කොමිෂන් සභාව වෙත ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය.

24. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ මේ කොටසේ-

"ක්‍රීඩා සඳහා වෙන්වූ නාලිකාව" යන්නෙන් විකාශන කාලයෙන් සියයට අනූවක ප්‍රතිශතයක් ක්‍රීඩා සම්බන්ධ වැඩසටහන් විකාශනය කිරීම සඳහා වෙන් කර ඇති රූපවාහිනී නාලිකාවක් අදහස් වේ;

"තැනැත්තා" යන්නට සංස්ථාගත කරන ලද හෝ සංස්ථාගත නොකරන ලද පුද්ගල මණ්ඩලයක් ඇතුළත් වේ.

## VII වන කොටස
## මන්දිර බද්ද

25. (1) 2015 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන සෑම වර්ෂයක් සඳහා ම, 2000 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු ඉදිකරන ලද මන්දිරයක සෑම අයිතිකරුවකුගෙන් ම, වාර්ෂිකව රුපියල් මිලියන එකක් වන (මේ කොටසේ මින්මතු "බද්ද" යනුවෙන් සඳහන් කරනු ලබන) මන්දිර බද්ද යනුවෙන් හඳුන්වනු ලබන බද්දක් අය කරනු ලැබිය යුතු ය.

(2) බද්ද සමාන වාරික හතරකින් අනුපිළිවෙලින් පහත දැක්වෙන ආකාරයට ගෙවිය යුතු ය:—

(අ) පළමුවන වාරිකය අදාළ තක්සේරු වර්ෂයේ ජූලි මස පහළොස්වන දින හෝ එදිනට පෙර;

(ආ) දෙවන වාරිකය අදාළ තක්සේරු වර්ෂයේ ඔක්තෝබර් මස පහළොස්වන දින හෝ එදිනට පෙර ;

(ඇ) තෙවන වාරිකය අදාළ තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එළැඹෙන වර්ෂයේ ජනවාරි මස පහළොස්වන දින හෝ එදිනට පෙර;

(ඈ) හතරවන වාරිකය අදාළ තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එළැඹෙන වර්ෂයේ අප්‍රේල් මස පහළොස්වන දින හෝ එදිනට පෙර.

(3) බද්ද කොමසාරිස් ජනරාල්වරයා විසින් එකතු කරනු ලැබිය යුතු අතර, එකතු කිරීමේ දිනයේ සිට දින පහළොවක් ඇතුළත ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය.

(4) යම් ගොඩනැගිල්ලක වටිනාකම නිශ්චය කිරීමේ දී කළ යුතු යථාවත් කිරීම් ද ඇතුළත්ව, මේ කොටසේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය විය හැකි විධිවිධාන, මේ පනත යටතේ සාදනු ලබන නියෝග මගින් නියම කළ යුතු ය.

26. (1) මේ කොටස යටතේ බද්ද ගෙවීමට යටත් වන යම් මන්දිරයක අයිතිකරුවෙක්, ඒ බද්ද මේ කොටසේ විධිවිධාන සලස්වා ඇති පරිදි ගෙවීම පැහැර හරිනු ලැබූ අවස්ථාවක ඔහු මේ පනත යටතේ බදු පැහැර හරින්නකු ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ XII වන පරිච්ඡේදයේ, XXII වන පරිච්ඡේදයේ, XXIII වන පරිච්ඡේදයේ, XXIV වන පරිච්ඡේදයේ, XXV වන පරිච්ඡේදයේ, XXVI වන පරිච්ඡේදයේ, XXVII වන පරිච්ඡේදයේ, XXX වන පරිච්ඡේදයේ සහ XXXI වන පරිච්ඡේදයේ විධිවිධාන, එවැනි යම් බදු පැහැර හරින්නකු සඳහා ද, ඔහු සම්බන්ධයෙන් ද, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.".

27. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ මේ කොටසේ-

"කොමසාරිස් ජනරාල්වරයා" යන්නෙන් 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත යටතේ පත් කරන ලද හෝ පත්කරන ලදැයි සලකනු ලබන දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා අදහස් වේ;

"මන්දිරය" යන්නෙන්, වාසික කාර්යය සඳහා 2000 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසු ඉදි කරන ලද, අදාළ ගොඩනැගිල්ල පිහිටි පළාත් පාලන බල ප්‍රදේශයේ පළාත් පාලන ආයතනය විසින් අනුමත කරන ලද ගොඩනැගිලි සැලැස්මට අනුව බිම් ප්‍රදේශය වර්ග අඩි දස දහසකට නොඅඩු හෝ රජයේ ප්‍රධාන තක්සේරුකරු හෝ ඔහු විසින් බලය පවරන ලද යම් නිලධරයකු විසින් නියම කරනු ලැබිය හැකි ආකාරයට යථාවත් කර, නිශ්චය කරන ලද පරිදි, යම් අදාළ වර්ෂයක අප්‍රේල් මස පළමු වන දිනට වටිනාකම රුපියල් මිලියන

එකසිය පනහකට නොඅඩු වූ යම් ගොඩනැගිල්ලක් අදහස් වන අතර, සහාධිපත්‍ය දේපළක් සම්බන්ධයෙන් වන විට, එම දේපළේ සහාධිපත්‍ය ඒකකයක් මේ කොටසේ කාර්ය සඳහා ගොඩනැගිල්ලක් වශයෙන් සලකනු ලැබිය යුතු ය;

"මන්දිරයක අයිතිකරු" යන්නෙන්, ඉඩම් අයිතිය පාලනය කෙරෙන ලිඛිත නීති යටතේ, අදාළ මන්දිරය පිහිටා ඇති ඉඩමේ හිමිකාරිත්වය දරන තැනැත්තකු හෝ තැනැත්තන් අදහස් වන අතර, සහාධිපත්‍ය දේපළක් සම්බන්ධයෙන් වන විට, එම දේපළේ සහාධිපත්‍ය ඒකකයක අයිතිකරුවකු මේ කොටසේ කාර්ය සඳහා මන්දිරයේ අයිතිකරු වශයෙන් සලකනු ලැබිය යුතු ය.

VIII වන කොටස

## විගමන බද්ද

28. (1) 2015 නොවැම්බර් මස 1 වන දින සිට බලපවත්වන පරිදි, ස්ථිරව ශ්‍රී ලංකාව හැර යන සෑම ශ්‍රී ලාංකික පුරවැසියකුගෙන්ම, එම පුරවැසියාට රටින් පිටතට ගෙන යාම සඳහා නිදහස් කරන ලද විදේශ විනිමය මත සියයට විස්සක අනුප්‍රමාණයකට, (මේ කොටසේ මින්මතු "බද්ද" යනුවෙන් සඳහන් කරනු ලබන) විගමන බද්ද යනුවෙන් හඳුන්වනු ලබන බද්දක් අය කරනු ලැබිය යුතු ය.

(2) බද්ද කොමසාරිස් ජනරාල්වරයා විසින් එකතු කරනු ලැබිය යුතු අතර, එකතු කරනු ලැබූ දිනයේ සිට දින පහළොවක් ඇතුළත ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය.

(3) මේ කොටසේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි විධිවිධාන, මේ පනත යටතේ සාදනු ලබන නියෝග මගින් නියම කළ යුතු ය.

29. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ මේ කොටසේ—

"කොමසාරිස් ජනරාල්වරයා" යන්නෙන්, 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත යටතේ පත් කරන ලද හෝ පත්කරන ලදැයි සලකනු ලබන දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා අදහස් වේ;

"ශ්‍රී ලාංකික පුරවැසියා" යන්නට, (349 වන අධිකාරය වූ) පුරවැසි පනත යටතේ එම යෙදුමට දී ඇති අර්ථය ම ඇත.

IX වන කොටස

## මෝටර් වාහන ආනයනකරුවන්ගේ බලපත්‍ර ගාස්තුව

30. (1) 2016 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන සෑම වර්ෂයක් සඳහා ම, සෑම මෝටර් වාහන ආනයනකරුවකුගෙන් ම, වර්ෂයකට රුපියල් ලක්ෂ පහළොවක් වන (මේ කොටසේ මින්මතු "ගාස්තුව" යනුවෙන් සඳහන් කරනු ලබන) මෝටර් වාහන ආනයනකරුවන්ගේ බලපත්‍ර ගාස්තුව යනුවෙන් හඳුන්වනු ලබන ගාස්තුවක් අය කරනු ලැබිය යුතු ය:

එසේ වුවද, පෞද්ගලික පරිහරණය සඳහා වාහනයක් ආනයනය කරන යම් තැනැත්තකු ගාස්තුව ගෙවීමට යටත් නොවිය යුතුය.

(2) පෞද්ගලික පරිහරණය සඳහා ආනයනය කරන ලද, (1) වන උපවගන්තිය යටතේ ගාස්තුව ගෙවනු නොලැබූ මෝටර් වාහනයක හිමිකාරත්වය, වාණිජ පරමාර්ථයක සම්බන්ධයක් නොමැති බවට ඒ ආනයනකරුවා විසින් මෝටර් වාහන කොමසාරිස් ජනරාල්වරයා සෑහීමකට පත් වන පරිදි සනාථ කරනු ලබන්නේ නම් මිස, ඒ මොටර් වාහනය ආනයනකරුවාගේ නමින් ලියාපදිංචි කරන ලද දිනයේ සිට වසර හතරක කාලයකට දෙවන අයිතිකරුවකුට පවරනු නොලැබිය යුතු ය :

එසේ වුව ද, ඒ මෝටර් වාහනය සම්බන්ධයෙන් ආනයනකරුවා විසින් 1988 අංක 30 දරන බැංකු පනත යටතේ බලපත්‍රලාභී බැංකුවක් සමග හෝ 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ බලපත්‍රලාභී මුදල් සමාගමක් සමග හෝ 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනත යටතේ ලියාපදිංචි කරන ලද කල්බදු මූල්‍යකරණ ආයතනයක් සමග හෝ, එළඹෙන ලද, කුලී සින්නක්කර ගිවිසුමක හෝ කල්බදු මූල්‍යකරණ ගිවිසුමක ඇපයක් වශයෙන් ඒ මෝටර් වාහනයේ හිමිකාරත්වය ඒ බැංකුව, මුදල් සමාගම හෝ කල්බදු මූල්‍යකරණ ආයතනය වෙත පවරනු ලැබීම, මේ පනතේ කාර්ය සඳහා හිමිකාරත්වය පැවරීමක් ලෙස සලකනු නොලැබිය යුතු ය.

(3) ගාස්තුව 2016 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන සෑම වර්ෂයක් සඳහා ම අදාළ වර්ෂයට පෙරාතුව ම වූ වර්ෂයේ දෙසැම්බර් මස තිස් එක් වන දින හෝ එදිනට පෙර ගෙවනු ලැබිය යුතු ය.

(4) ගාස්තුව නියම කරනු ලබන ආකාරයට මෝටර් වාහන කොමසාරිස් ජනරාල්වරයා විසින්, එකතු කරනු ලැබිය යුතු අතර, එකතු කිරීමේ දිනයේ සිට දින පහළොවක් ඇතුළත ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය.

(5) මේ කොටසේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි විධිවිධාන, මේ පනත යටතේ සාදනු ලබන නියෝග මගින් නියම කළ යුතු ය.

31. (1) 30 වන වගන්තියේ විධිවිධාන සලස්වා ඇති පරිදි ගාස්තුව ගෙවීම පැහැර හරින යම් තැනැත්තකු, මේ පනත යටතේ බදු පැහැර හරින්නකු ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) එවැනි යම් බදු පැහැර හරින්නකුට එරෙහිව නඩු පැවරීමට සහ පැහැර හරින ලද ගාස්තුව අය කර ගැනීම සඳහා සහ ඒ සම්බන්ධයෙන්, 32 වන වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

32. (1) ගාස්තුව හෝ එයින් යම් කොටසක් ගෙවීම පැහැර හරිනු ලැබ ඇති විට, ගෙවීම පැහැර හැර ඇති මුදල් ප්‍රමාණය සහ බදු පැහැර හරින්නාගේ නම සහ අවසාන වතාවට දැන සිටි පදිංචි ස්ථානය හෝ ව්‍යාපාරික ස්ථානයේ ලිපිනය පිළිබඳ විස්තර ඇතුළත් වන සහතිකයක්, මෝටර් වාහන කොමසාරිස් ජනරාල්වරයා විසින්, ඒ ස්ථානය කෙරෙහි අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත්වරයා වෙත නිකුත් කරනු ලැබිය යුතු ය.

(2) එවිට මහේස්ත්‍රාත්වරයා විසින්, බදු පැහැර හරින්නාට එරෙහිව එසේ ගෙවීම පැහැර හරිනු ලැබූ ගාස්තුව අයකර ගැනීම පිණිස නඩු කටයුතු පවත්වාගෙන නොයා යුත්තේ මන්ද යන වගට හේතු දැක්වීම සඳහා බදු පැහැර හරින්නා කැඳවනු ලැබිය යුතු ය.

(3) බදු පැහැර හරින්නා විසින් ප්‍රමාණවත් හේතු දැක්වීමක් කරනු නොලැබුවහොත්, එම ගෙවීම පැහැර හැර ඇති ගාස්තුව ඒ පැහැර හරින්නාට මහේස්ත්‍රාත්වරයා විසින් නියම කරන ලද දඩ මුදලක් සේ මහේස්ත්‍රාත්වරයාගේ ආඥාවක් මගින් අය කරගනු ලැබිය යුතු අතර, එසේ අය කර ගනු ලැබූ විට ඒකාබද්ධ අරමුදලට බැර කිරීම සඳහා මෝටර් වාහන කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය.

33. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ මේ කොටසේ—

"මෝටර් වාහන කොමසාරිස් ජනරාල්වරයා" යන්නෙන්, (203 වන අධිකාරය වූ) මොටර් වාහන පනතේ 204 වන වගන්තිය යටතේ පත් කරන ලද මෝටර් වාහන කොමසාරිස් ජනරාල්වරයා අදහස් වේ;

"මෝටර් වාහනය" යන්නෙන්, මෝටර් කාර් රථයක්, ද්විත්ව කාර්ය වාහනයක්, මගී ධාරිතාව මගීන් දහසයකට අඩු සැහැල්ලු මෝටර් කෝච් රථයක් සහ මේ පනත යටතේ සාදනු ලබන නියෝග යටතේ නියම කරනු ලබන වෙනත් යම් වාහනයක් අදහස් වේ.

## X වන කොටස
## පොදු විධිවිධාන

34. මේ පනත යටතේ පනවන ලද අය බද්දක්, බද්දක් හෝ ගාස්තුවක් ගෙවීම, පුද්ගල මණ්ඩලයක් විසින් පැහැර හරිනු ලැබූ විට, එම පුද්ගල මණ්ඩලය-

(අ) සංස්ථාපිත පුද්ගල මණ්ඩලයක් නම්, ඒ සංස්ථාපිත පුද්ගල මණ්ඩලයේ සෑම අධ්‍යක්ෂවරයකු ම සහ නිලධරයකු ම ; හෝ

(ආ) වෙළඳ ව්‍යාපාරයක් නම්, ඒ වෙළඳ ව්‍යාපාරයේ සෑම හවුල්කරුවකු ම ; හෝ

(ඇ) වෙළඳ ව්‍යාපාරයක් නොවන සංස්ථාපිත නොකළ පුද්ගල මණ්ඩලයක් නම්, ඒ පුද්ගල මණ්ඩලයේ කළමනාකරණයේ සහ පාලනයේ වගකීම දරන සෑම නිලධරයකු ම,

මේ පනතින් විධිවිධාන සලසා ඇති පරිදි ඒ අය බද්ද, බද්ද හෝ ගාස්තුව අයකර ගනු ලැබීම සඳහා ඔහුට නඩු පවරනු ලැබීමට යටත් විය යුතු ය.

35. (1) නියම කළ යුතු යැයි මේ පනතින් නියමිත හෝ නියෝග සෑදීමට මේ පනත යටතේ බලය දී ඇති සියලු කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරන ලද දිනයෙහි හෝ එහි නිශ්චිතව සඳහන් යම් පසු දිනයක හෝ බලාත්මක විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක්ම, එය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මනින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ සෑම නියෝගයක් ම එහි අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොවිය යුතු ය.

(4) නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකෙන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

36. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

## උපලේඛනය

1. (ස්ථානීය පරිභෝජනය සඳහා නොවන දේශීයව නිෂ්පාදිත විදේශීය මත්පැන් ද ඇතුලුව) විදේශීය මත්පැන් සිල්ලරට විකිණීමේ බලපත්‍රය. (සුරා බදු ර.බී.4)
2. හෝටල්වල නේවාසිකයන්ට ලබා දෙන (දේශීයව නිෂ්පාදිත ධාන්‍ය මත්පැන් ඇතුලුව) විදේශීය මත්පැන් සැපයීම සඳහා ලබා දෙන බලපත්‍රය. (සුරා බදු ර.බී.7)
3. ස්ථානීය පරිභෝජනය සඳහා වන විදේශීය මත්පැන් අලෙවිය සඳහා වන (දේශීයව නිෂ්පාදිත ධාන්‍ය මත්පැන් ඇතුලුව) විනෝද පීඨිකා බලපත්‍රය. (සුරා බදු ර.බී.9)
4. දුම්රිය භෝජනාගාරයක් තුළ (දේශීයව නිෂ්පාදිත ධාන්‍ය මත්පැන් ඇතුලුව) විදේශීය මත්පැන් අලෙවිය සඳහා වන බලපත්‍රය. (සුරා බදු ර.බී. 10)
5. ආපනශාලාවක් තුළ (දේශීයව නිෂ්පාදිත ධාන්‍ය මත්පැන් ඇතුලුව) විදේශීය මත්පැන් අලෙවිය සඳහා වන බලපත්‍රය. (සුරා බදු ර.බී.11)
6. තානායමක (දේශීයව නිෂ්පාදිත ධාන්‍ය මත්පැන් ඇතුලුව) විදේශීය මත්පැන් අලෙවිය සඳහා වන බලපත්‍රය. (සුරා බදු ර.බී.12)
7. හිමිකාර සමාජශාලාවක (දේශීයව නිෂ්පාදිත ධාන්‍ය මත්පැන් ඇතුලුව) විදේශීය මත්පැන් අලෙවිය සඳහා වන බලපත්‍රය (සුරා බදු ර.බී.13)
8. සාමාජිකයන් සඳහා පමණක් වන සමාජශාලාවක සහ සමාජ කටයුතු හා විනෝද කටයුතු සඳහා වන සමාජශාලාවක (දේශීයව නිෂ්පාදිත ධාන්‍ය මත්පැන් ඇතුලුව) විදේශීය මත්පැන් අලෙවිය සඳහා වන බලපත්‍රය (සුරා බදු ර.බී.13ඒ)
9. බියර්, ඒල්, ස්ටවුට් විකිණීමේ විශේෂ බලපත්‍රය සහ වයින් සිල්ලරට විකිණීමේ බලපත්‍රය (සුරා බදු ර.බී.22ඒ)
10. බියර්, ඒල්, ස්ටවුට් සහ වයින් ස්ථානීය පරිභෝජනය සඳහා වන බලපත්‍රය (සුරා බදු ර.බී.22බී)

# මහ බැංකුවේ සහ ශ්‍රී ලංකාවේ බැංකු ආයතනවල වැඩ කටයුතු හා මෙහෙයුම්වලට අදාළ 2015 සම්මත කරන ලද අනෙකුත් නීති අණපනත්

1. 2015 අංක 9 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත
2. 2015 අංක 11 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත
3. 2015 අංක 12 දරන ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත
4. 2015 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත
5. 2015 අංක 14 දරන ඔට්ටු ඇල්ලීම හා සූදු බදු (සංශෝධන) පනත